Lesson 30 **කරමින් ඉඳ තිබෙනවා**

මෙතන ඉඳලා ඉගෙන ගන්න යන්නේ මේ පාඩම් මාලාවේ අපි ඉගෙන ගන්න අවසන් කාල තුන. ඉන් පළමු වැන්න අපිට මේ පාඩම් මාලාවේ මින් පෙර විවිධ අවස්ථා වලදී හමු වුනා

මේ එසේ හමු වූ එවැනි උදාහරණ දෙකක්

How long have you been waiting here ?
ඔයා කොච්චර වෙලා මෙතන බලන් ඉන්නවද ?

I have been waiting here for 20 minutes
මම විනාඩි 20ක් මෙතන බලන් ඉන්නවා

මේ කාලයෙන් කියන්නේ අතීතයේ යම් කිසි අවස්ථාවක ආරම්භ වී මේතාක් කල් කෙරී ගෙන යන ක්‍රියා ගැන. ඒ ක්‍රියාව මෙතනින් ඉදිරියටත් කෙරී ගෙන යන බව ඉන් අදහස් වෙනවා . අදාළ ක්‍රියාව යම් කලක් තිස්සේ " කරමින් ඉද තිබෙනවා " කියන එක තමයි
එම කාලයෙන් අදහස් වෙන්නේ. මෙහි වාක්‍යය සැකසෙන්නේ මේ විදියට

- කතෘ + has been / have been + (ක්‍රියා පදය +ing)

  [Has ඒක වචන කතෘ වරුන් සමගත් Have බහු වචන කතෘ වරුන් සමගත් යෙදෙන බව ඔබ දන්නවා]

බලමු උදාහරණ කිහිපයක්

I have been working here for 10 years now
දැන් අවුරුදු දහයක් තිස්සේ මම මෙහෙ වැඩ කරමින් ඉදලා තියෙනවා

We have been living here for about 20 years now
දැන් අවුරුදු දහයක් තිස්සේ අපි මෙහෙ ජීවත්න්වෙමින් ඉදල තියෙනවා

- බොහෝවිට මේ අදහස සිංහල බසින් කිව්වොත් අපි කියන්න ඉඩ තියෙන්නේ මෙන්න මේ විදියට
  දැන් අවුරුදු දහයක් තිස්සේ මම මෙහෙ වැඩ කරනවා / වැඩ කරලා තියෙනවා
  දැන් අවුරුදු 20ක් තිස්සේ අපි මෙහෙ ඉන්නවා / ඉදලා තියෙනවා

  සිංහල බසින් කොහොම කිව්වත් ඉංගීසියෙන් මේ tense එකේ වාක්‍යයක් කියවුනොත් ඒකෙන් අදහස් වෙන්නේ ඒ ක්‍රියාව අතීතයේ සිට මේ දක්වා කෙරිලා තියෙනවා සහ එය ඉදිරියටත් කෙරීගෙන යන බව. අපි මෙතැන් සිට අපිට වඩාත් හුරු සිංහල ඌරුවට මෙහි තේරුම් ටික අරගෙන බලමු

He has been working hard all his life
ඔහු මුලු ජිවිත කාලය පුරාම මහන්සි වෙලා වැඩ කරලා තියෙනවා

She has been growing flowers since her childhood
ඇය  ඇගේ  කුඩා කාලේ ඉදලම මල් වවල තියෙනවා

We have been trying to solve this problem
අපි උත්සහා කරමින් ඉන්නේ මේ ප්‍රශ්නේ විසදන්න ( solve - විසදනවා)

I have been trying to fix this since morning
මම උදේ ඉදන් උත්සාහ කරමින් ඉන්නේ මේක පිළියම් කරන්න

They have been quarreling all day
ඔවුන් මුළු දවස තිස්සෙම රණ්ඩු වෙනවා ( quarrel - ක්වරල් - රන්ඩු වෙනවා)

They have been playing music since morning
උදේ ඉදලම ඔවුන් සින්දු දානවා

This has been going on for some time now
මේක දැන් ටික කාලෙක ඉදල ඔය විදියට වෙනවා ( මෙය හොද වාක්‍යයක් ) ( (යමක් go on කියන්නේ එය දිගටම කෙරී ගෙන යනවා කියන එක )

I have been thinking about it
මම ඒ ගැන හිත හිත හිටියේ

He has been avoiding me for some time now
දැන් කාලෙක ඉදන් ඔහු මාව මග හරිනවා (avoid - අවොයිඩ් - මඟ හරිනවා )

(Doctors have given him warnings about his drinking several times) but he has been ignoring them
(ඔහුගෙ බීම ගැන දොස්තරලා කීප ගමනක් ඔහුට අවවාද කරලා තියෙනවා) නමුත් ඔහු ඒවා නොසලකා හරිමින් ඉද තිබෙනවා (ignore - ඉග්නෝ - නොසලකා හරිනවා )

She has been waiting for you for a long time
ඇය ගොඩක් කාලෙක ඉදන් ඔයා වෙනුවෙන් බලාගෙන ඉඳල තියෙනවා

We have been searching for hours, (but we still can’t find the place)
අපි පැය කිහිපයක් තිස්සේම හොයනවා, (නමුත් තාමත් අපිට තැන හොයා ගන්න බැහැ)

I have been feeling very tired all these days.
මට මේ දවස් ටිකේම  හරි මහන්සියක් දැනෙනවා

He has been driving since morning.
ඔහු උදේ ඉදන්ම (රථය) ධාවනය කරමින් ඉන්නේ

We have been looking for this file everywhere.
අපි මේ ෆයිල් එක හැමතැනම හොය හොය හිටියේ

I have been waiting to talk to you.
ඔයත් එක්ක කතා කරන්න මම බලාගෙන හිටියේ

They have been repairing the road for months, (and there's still a lot to be done)
ඔවුන් මාස කිහිපයක් තිස්සේම පාර අලුත්වැඩියා කරමින් ඉන්නේ, (නමුත් තව ගොඩාක් තියෙනවා කරන්න )

She has been writing this story since 2015
ඇය 2015 සිට මේ කතාව ලියමින් ඉන්නේ

I have been calling him all evening, (but he doesn't answer the phone)
මම හැන්දෑ වරුවම ඔහුට කෝල් කරනවා, ඔහු ෆෝන් එක ආන්සර් කරන්නේ නැහැ

I have been saving money all year for this trip
මම අවුරුද්ද පුරාම සල්ලි ඉතුරු කරමින් ඉන්නේ මේ ගමනට

They have been discussing the matter for weeks, (but they have not come to a decision )
ඔවුන් සති ගණනක් මේ කාරණය ගැන සාකච්ඡා කරමින් ඉන්නේ, (නමුත් ඔවුන් තීරනයකට ඇවිත් නැහැ )

We have been waiting for the bus for so long
අපි බස් එක එනකල් ගොඩාක් වෙලා බලාගෙන ඉන්නේ

She has been teaching here for ten years.
ඇය මෙහි අවුරුදු දහයක් තිස්සේ ඉගැන්වමින් ඉඳ තියෙනවා

I have been planning to buy a beachside property
වෙරළබඩ දේපොලක් මිලට ගන්න මම සැලසුම් කරමින් ඉන්නවා

They have been playing outside for a long time
ඔවුන් බොහෝ වෙලාවක් එළියේ ක්‍රීඩා කරමින් ඉඳලා තියෙනවා

They have been waiting outside for hours. The bus hasn't arrived yet
ඔවුන් එළියේ රැඳී සිට තියෙනවා පැය ගණනාවක් . බස් එක තාම ඇවිත් නැහැ

I have been looking for my keys since morning. (I still can't remember where I kept them.)
මම උදේ ඉඳලා මගේ යතුරු හොයනවා , (මට තාමත් මතක නැහැ මම කොහෙද ඒවා තිව්වේ කියලා)

I have been calling you repeatedly. (You didn't pick up the phone.)
මම දිගින් දිගටම ඔයාට කෝල් කරනවා . ඔයා ෆෝන් එක ඉස්සුවේ නැහැ (repeatedly - රිපීටඩ්ලි - නැවත නැවත)

We have been studying all day. (We need a short break now)
අපි උදේ ඉඳන් පාඩම් කරලා තියෙනවා . අපිට දැන් පොඩි විවේකයක් අවශ්‍යයි

They have been arguing since last night. (It seems they can't agree on something ) ඔවුන් ඊයේ රෑ ඉඳන් වාද කරගන්නවා .( ඔවුන්ට මොකක් හරි දේකට එකඟ වෙන්න බැරුව වගේ )
(argue - ආගිව් - වාද කරනවා )

I have been working on this project for weeks. ( Finally, it's almost finished )
මම සති ගානක් මේ ව්‍යපෘතිය වෙනුවෙන් වැඩ කරලා තියෙනවා , දැන් ඒක ඉවර වෙන්න ඔන්න මෙන්න

We have been searching for the dog everywhere. (It must have run far away.)
මම හැමතැනම බල්ලව හොයනවා . (ඌ ඈතට දුවලා වෙන්න ඕන)

I have been trying to find a solution for this problem for a few years now but unsuccessfully
මම දැන් වසර ගනනාවක් කිස්සෙ මේ ගැටලුවට පිලිතුරක් හොයන්න මහන්සි වෙනවා නමුත් සාර්ථකත්වයක් නැතිව (unsuccessfully - අන්සක්සස්ෆුලි - අසාර්ථක ලෙස)

We have been planning this trip since last year
අපි ගිය අව්රුද්දෙ ඉඳන් මේ ට්‍රිප් එක ප්ලෑන් කරමින් ඉන්නේ

- එහි නැතාර්තයේදී සරල ලෙස has , have වලට not එකතු වෙනවා

I have not been feeling well for a few days
මට දවස් කිපෙක ඉඳන් එච්චර සනීප නෑ

She has not been listening to me.
ඇය මට ඇහුම්කන් දෙන්නේ නෑ ( මා කොච්චර කිව්වත් )

I haven't been sleeping well these days.
මේ දවස් ටිකේම මම හොඳට නිදාගෙන නැහැ

She hasn't been eating on time
ඇය වේලාවට කන්නෙ නෑ (දැන් ටික කලෙක ඉඳන් ඇය වෙලාවට කන්නේ නැහැ ) .

We have not been getting enough rain this year
මේ අව්රුද්දෙ අපිට ප්‍රමාණවත් වැස්සක් ලැබිලා නැහැ

He hasn't been attending classes for a week.
ඔහු සතියක් තිස්සෙ පන්ති වලට එන්නේ නෑ.

I haven't been using this phone much lately
මම මෑතකාලෙ මේ ෆෝන් එක වැඩියෙන් භාවිතා කරන්නේ නෑ

(I have asked them many times) They have not been trying to fix the problem
(මම ඔවුන්ට බොහෝ වර කියා තිබෙනවා) ඔවුන් ගැටලුව පිළිසකර කරන්න උත්සාහ කරන්නේ නෑ

He hasn't been taking his medicine regularly because he can't afford it.
ඔහු අඛණ්ඩව බෙහෙත් අරගෙන නැහැ ඔහුට එය දරන්න(වියදම) බැරි නිසා

- ප්‍රශ්නාර්තයේදී has, have ඉස්සරහට එනවා

Have you been waiting for me ?
ඔයා මම එනකල් බලන් හිටියද ? ( එයා එතනට එනකොට අනික් කෙනා එතන ඉන්නවා දකිනවා . එතකොටයි මේ ප්‍රශ්නේ අහන්නේ )

Has she been studying all day ?
ඇය මුළු දවසෙම පාඩම් කරමින්ද ඉන්නේ ? ( ඇය උදේ ඉදන් මේ ප්‍රශ්නය අසන අවස්තාව වෙනකල්ම පාඩම් කරමින්ද හිටියේ කියල ඔය අහන්නේ )

Have you been working here for long?
ඔයා ගොඩක් කාලෙක ඉඳලා මෙතන වැඩ කරමින් ඉන්නවද?

Have they been living in abroad for years?
ඔවුන් වසර ගණනාවක් තිස්සේ පිටරටද ජීවත් වෙන්නේ ?

Have you been waiting too long?
ඔයා ගොඩක් වෙලා බලාගෙන ඉන්නවද ?

Has he been behaving in this manner lately ?
ඔහු මෑතක සිට මේ ආකාරයට හැසිරෙමින් ඉන්නවද ? (lately - ලේට්ලි - මෑතකදී )

Has she been cleaning all day?
ඇය මුළු දවස පුරාම පිරිසිදු කරමින්ද ඉන්නේ?

Have they been making trouble for you all the time?
ඔවුන් සෑම වෙලාවකම ඔබට කරදර කරමින්ද ඉන්නේ ?

Has it been going on like this for the past few months?
පසුගිය මාස කීපය පුරාම මේ විදියටම සිදුවීගෙන යනවද ?

What have you been doing here ?
ඔයා මොනවද මෙතන කරකර හිටියේ ?

Where have they been living since their father's demise?
ඔවුන්ගේ පියාගේ මරණයේ සිට (ඊට පසු ) ඔවුන් කොහෙද ජීවත් වෙමින් ඉන්නේ ?

Have you been facing this problem recently?
ඔයා මෑතකාලේ මේ ගැටලුවට මුහුණ දෙමින් ඉන්දවද?

Has she been feeling better since the surgery?
ශෛල්‍ය කර්මයෙන් පසු අය සුවය ලබමින්ද ඉන්නේ ?

Has it been raining all week?
සතිය පුරාම වහිනවද ?

How long have you been doing this ?
ඔයා කොච්චර කල් මේක කරලා තියෙනවද ? (කරමින් ඉදලා තියෙනවද ? )

How long has it been raining ?
කොච්චර වෙලා වහිනවද ? (කොච්චර වෙලාවක් තිස්සෙ වහිනවද ?)

Have you been following my instructions ?
ඔයා මගේ උපදෙස් අනුගමනය කරමින්ද ඉන්නේ ? (follow ෆොලෝ - අනුගමනය කරනවා )
(instruction - ඉන්ස්ට්‍රක්ෂන් - උපදෙස )

හොදයි , මේ tense එකට කියන්නෙ present perfect continuous tense කියලා. ඒක වැඩියම පාවිච්චි නොවන tense එකක් , නමුත් එය අවශ්‍ය මොහොතේදී නිවැරදිව පාවිච්චි කරානම් ඔබ පවසන දේට හරි අර්ථය ලැබෙනවා

Lesson 30 **Spoken English**

Buying a house in Colombo
කොළඹින් නිවසක් මිලට ගැනීම

මෙය තරමක් දීර්ඝ නමුත් සරල කෙටි වාක්‍ය වලින් සැදී දෙබසක්. ඇත්තටම මේ වනවිට ඔබට මෙවැනි දෙබසක නිරත වීමට අවශ්‍ය දැනුම බොහෝ ප්‍රමාණයක් ලැබිලා තියෙනවා . ඒ ඔබට ලැබී තිබෙන ප්‍රමාණය තුල ප්‍රමාණය තුල කොතරම් ලස්සනට මේ භාෂාව හැසිරවිය හැකිදැයි පෙන්වන හොඳ උදාහරණයක් මේ දෙබස. මේවා සරල ලස්සන දෙබස් . මේ මට්ටමට ඔබේ හැකියාව වර්ධනය කරගත්තා නම් ඇත්තටම ඔබ දිනුම්

A- Is Mr. silva in ?
ඉස් මිස්ට(ර්) සිල්වා ඉන් ?
මිස්ට(ර්) සිල්වා ඉන්නවද ?

B- No, he is not in. He has just gone out
නෝ . හී ඉස් නොට් ඉන් , හී හෑස් ජස්ට් ගෝන් අවුට්
නෑ , ඔහු නැහැ , එයා මේ දැන් එලියට ගියේ

A- Will he take long to come back
විල් හී ටේක් ලෝං ටු කම් බැක්
ඔහු එන්න ගොඩක් වෙලා යයිද ? (take long - ගොඩාක් වෙලා යනවා )

B- I am not sure , He didn't say anything . Perhaps he will be back soon. If he has gone to the market,however , he will take some time to come back. Can I know who you are ?
අයෑම් නොට් ෂුව(ර්) , හි ඩිඩ්න්ට් සේ එනිතිං , ප(ර්හැ)ප්ස් හී විල් කම් බැක් සූන්. ඉෆ් හී හෑස් ගෝන් ටු ද මාර්කට්, හව්එව(ර්), හී විල් ටේක් සම් ටයිම් ටු කම් බැක්. කැන් අයි නෝ හූ යූ ආ ?
මට ෂුව(ර්) නැහැ , ඔහු මුකුත් කිව්වේ නැහැ , සමහර විට එයා ඉක්මනින් ඒවි. එයා මා(ර්කට් එකට ගිහිල්ලා නම් කොහොමහරි එන්න ටිකක් වෙලා යාවි , ඔයා කව්ද කියලා මට දැන ගන්න පුලුවන්ද ?

A - I am Wasantha, I am from Galle. A friend of mine , Nilantha asked me to come and meet Mr. Silva
අයෑම් වසන්ත , අයැම් ෆ්‍රොම් ගෝල් . අ ෆ්‍රෙන්ඩ් ඔෆ් මයින් , නිලන්ත ආස්ක්ඩ් මී ටු කම් ඇන්ඩ් මීට් මිස්ට(ර්) සිල්වා
මම වසන්ත ගාල්ලේ ඉදලා, නිලන්ත කියලා මගේ යාලුවෙක් කිව්වා ඇවිල්ල මිස්ට(ර්) සිල්වාව හම්බ වෙන්න කියලා

B- Oh yeah, Nilantha is a good friend of his . Please come in and have a seat
ඕ.. යාහ් , නිලන්ත ඉස් අ ගුඩ් ෆ්‍රෙන්ඩ් ඔෆ් හිස් , ප්ලීස් කම් ඉන් ඇන්ඩ් හැව් අ සීට්
ආ .. ඔව් , නිලන්ත එයාගේ හොඳ යාලුවෙක් , ඇතුලට ඇවිල්ලා වාඩි වෙන්න

A Thank you , he told me Mr. Silva is going to sell a house close to Galle road
තැනක් යූ , හී ටෝල්ඩ් මී මිස්ට(ර්) සිල්වා ඉස් ගොයින් ටු සෙල් අ හවුස් ක්ලෝස් ටු ගෝල් රෝඩ්
ස්තුතියි, එයා මට කිව්වා මිස්ටර් සිල්වා ගාලු පාරට කිට්ටුව ගෙයක් විකුනන්න යනවයි කියලා
.
B- Yes , he is going to sell his ancestral home in Katubedda. Are you looking to buy a house here ?
යස්, හී ඉස් ගොයිං ටු සෙල් හිස් ඇන්සෙස්ට්‍රල් හෝම් ඉන් කටුබැද්ද . ආ යූ ලුකින් ටු බයි අ හවුස් හියර්) ?

ඔව්, කටුබද්දේ එයාගේ මහා ගෙදර විකුනන්න යනවා . ඔයා මෙහෙන් ගෙයක් ගන්න හොයනවද ? (ancestral home - මහ ගෙදර)

A - Yes , I am looking to buy a house near here, because my two children have completed their A/L s and they are looking to enter into private universities here
යස් අයෑම් ලුකින් ටු බයි අ හවුස් නියර්) හියර්) බිකෝස් මයි ටු චිල්ඩ්‍රන් හෑව් කම්ප්ලීටඩ් දෙයා(ර්) ඒ ලෙවල්ස් ඇන්ඩ් දේ ආ ලුකින් ටු එන්ට(ර්) ඉන්ටු ප්‍රයිවට් යුනිව(ර්සි)ටිස් හියර්)
ඔව් මම මේ කිට්ටුව ගෙයක් ගන්න බලනවා, මොකද මගේ ළමයි දෙන්න ඒගොල්ලන්ගේ ඒ ලෙවල් ඉවර කරලා ඉන්නේ. ඒගොල්ලෝ මෙහෙ පුද්ගලික විශ්ව විද්‍යාල වලට ඇතුල් වෙන්න බලන්නේ

B- Really ! Then it's definitely more convenient for them to be here
රියලි ! දෙන් ඉට්'ස් ඩෙෆිනිට්ලි මෝ කන්වීනියන්ට් ෆෝ දෙම් ටු බී හියර්)
හැබෑට ! එහෙනම් ඒගොල්ලන්ට මෙහෙ ඉන්න එක අනිවාර්යයෙන්ම ලොකු පහසුවක් (to be - ඉන්න / වෙන්න / පත් වෙන්න)

A- Yes, you are correct . Do you have any idea how much it will cost ?
යස්, යූ ආ  කරෙක්ට් . ඩූ යූ හැව් එනි අයිඩියා හව් මච් ඉට් විල් කොස්ට් ?
ඔව් , ඔබ හරි , ඔයා දන්නවද ඒක කියක් වෙයිද කියලා ?

B- I cannot say exactly, You have to ask Mr. Siva himself
අයි කැනොට් සේ එක්සෑට්ලි . යූ හැව් ටු ආස්ක් මිස්ට(ර්) සිල්වා හිම්සෙල්ෆ්
මට හරියටම කියන්න බෑ . ඔයාට මිස්ට(ර්) සිල්වාගෙන්ම  අහන්න වෙනවා

A- First of all , I want to know whether it's affordable for me
ෆස්ට් ඔෆ් ඕල් , අයි වෝන්ට් ටු නෝ වෙද(ර්) ඉට්ස් අෆෝඩබල්  ෆෝ මී
ඔක්කොටම කලින්, මට දැනගන්න ඕන ඒක මට දරන්න පුලුවන්ද කියන එක

B- Didn't Nilantha say anything about the price ?
ඩිඩින්ට් නිලන්ත සේ එනිතිං අබව්ට් ද ප්‍රයිස් ?
නිලන්ත ගාන ගැන මුකුත් කිව්වේ  නැද්ද ?

A- No, He didn't say anything . But he said Mr. Silva will surely give me a reasonable price
නෝ හී ඩිඩින්ට් සේ එනිතිං , බට් හී සේඩ් මිස්ට(ර්) සිල්වා විල් ෂුව(ර්)ලි ගිව් මී  අ රීසනබල් ප්‍රයිස්
ඔහු මුකුත් කිව්වේ නෑ , නමුත් එයා කිව්වා මිස්ට(ර්) සිල්වා මට සාධාරණ ගානක් කියයි කියලා

B- Yeah , he will surely give a reasonable price , but you will have to wait until he comes . How about a cup of tea ?
යෙහ් , හී විල් ෂුව(ර්)ලි ගිව් අ රීසනබල් ප්‍රයිස් , බට් යූ විල් හැව් ටු වේට් අන්ටිල් හී කම්ස් , හව් අබවුට් අ කපොෆ් ටී ?
ඔව්, එයා ෂුවර් එකටම සාධාරණ ගානක් දෙයි , ඒත්  ඔයාට ඉන්න වෙනවා එයා එනකල් , තේ එකක් බොමුද ?

A - Yes , that's a good idea , Thanks . By the way , why are you selling that house ?
යස්  , දැට්ස් අ ගුඩ් අයිඩියා , තෑන්ක්ස් , බයි ද වේ , වයි ආ යූ  සෙලින් දැට් හවුස් ?
ඔව්, ඒක  හොඳ අදහස, ස්තුතියි , ඒක නෙවෙයි, ඇයි ඕගොල්ලෝ ඒ ගේ විකුනන්නේ ?

B- It's because we need some money for our younger son's education . He is doing his masters in England
ඉට්ස් බිකෝස්  වී නීඩ් සම් මනී ෆෝ අව(ර්) යංග(ර්) සන්ස් එඩියුකේෂන් , හී ඉස් ඩුයිං හිස් මාස්ට(ර්ස්) ඉන් ඉංග්ලන්ඩ්
අපේ බාල පුතාගේ ඉගෙනීමට අපට සල්ලි වගයක් ඕන නිසා, එයා එංගලන්තේ පශ්චාත් උපාධිය හදාරනවා

A - I see , It must cost a lot
අයි සී , ඉට්  මස්ට් කොස්ට් අ ලොට්
එහෙමද ! ඒකට  සෑහෙන ගානක් යනවා ඇති (සැහෙන ගානක් යනවා විය යුතුයි)

B- Yes , It costs a lot of money. It ‘s not an easy thing to do , you know
යස් , ඉට් කොස්ට්ස් අ ලොටොෆ් මනී , ඉට්ස් නොට් ඇන් ඊසි තිං ටු ඩූ , යූ නෝ
ඔව් , ඒකට ගොඩක් සල්ලි යනවා , ඒක කරන්න ලේසි දෙයක් නෙමෙයි, ඔයා දන්නවනේ

A - Yes , That’s why I am getting my children into local universities , I can't afford to send them to England. By the way , Is that house in good condition ?
යස් , දැට්ස් වයි අයෑම් ගෙටිං මයි චිල්ඩ්රන් ඉන්ටු ලෝකල් යුනිව(ර්සි)ටීස් , අයි කාන්ට් අෆෝඩ් ටු සෙන්ඩ් දෙම් ටු ඉංග්ලන්ඩ් .බයි ද වේ ,ඉස් දැට් හවුස් ඉන් ගුඩ් කන්ඩිෂන් ?
ඔව්, එක තමයි මම මගේ ළමයි මෙහෙ විශ්ව විද්‍යාල වලට දාන්නෙ , මට ඒගොල්ලන්ව එංගලන්තෙට යවන්න වියදම් දරන්න බෑ , ඒක නෙවෙයි , ඒ ගෙදර හොඳ තත්වයේ තියෙනවද ?

B - Yes , it’s in very good condition. We recently did some repairs too. Repairs alone cost some 5 lakhs.
යස් ,ඉට්’ස් ඉන් වෙරි ගුඩ් කන්ඩිෂන් , වී රීසන්ට්ලි ඩිඩ් සම් රිපෙයා(ර්)ස් ටූ. රිපෙයා(ර්ස් අලෝන් කොස්ට් සම් 5 ලැක්ස් .
ඔව් ඒක ඉතාම හොඳ තත්වයේ තියෙනවා , අපි මේ ළඟදි රෙපෙයා(ර්)ස් වගේකුත් කළා , රෙපෙයාර්ස් වලටම විතරක් ලක්ෂ 5ක් ගියා (repairs alone - රිපෙයාර්ස්ම පමනක්/ ඒකම විතරක් )
( cost - වැය වෙනවා . එහි අතීත කාලයත් cost මයි)

A - I see , What’s the extent of the land ?
අයි සී , වට්ස් ද එක්ස්ටෙන්ට් ඔෆ් ද ලෑන්ඩ් ?
එහෙමද , ඉඩමේ ප්‍රමාණය කීයද ?

B- It’s 20 perches. It has a front garden and a small backyard . You have enough space to put in some plants too .
ඉට්ස් 20 ප(ර්ච)ස් . ඉට් හැස් අ ෆ්‍රන්ට් ගා(ර්)ඩ්න් ඇන්ඩ් අ ස්මෝල් බැක් යාඩ් , යූ හැව් ඉනෆ් ස්පේස් ටු පුට් ඉන් (පුටින්) සම් ප්ලාන්ට්ස් ටූ
ඒක පර්චස් 20යි , ඒකට මිදුලක් තියෙනවා , පොඩි පිලිකන්නක් තියෙනවා , ඔයාට පැල ටිකක් වවාගන්නත් ඉඩ තියෙනවා

A- By the way , If Mr. Silva is taking too long to come home, I will go and come back later . I also have to visit a friend of mine in Mt. Lavinia
බයි ද වේ , ඉෆ් මිස්ට(ර්) සිල්වා ඉස් ටේකින් ටූ ලෝං ටු කම් හෝම්, අයි විල් ගෝ ඇන්ඩ් කම් බැක් ලේට(ර්) , අයි ඕල්සෝ හැව් ටු විසිට් අ ෆ්‍රෙන්ඩ් ඔෆ් මයින් ඉන් මවුන්ට් ලැවීනියා
ඒක නෙවෙයි , මිස්ටර් සිල්වා ගෙදර එන්න පරක්කු වෙනවා නම් මම ගිහිල්ල ආපහු එන්නම් , මට ගල්කිස්සේ මගේ යාළුවෙක්ව බලන්නත් තියෙනවා

B- Oh no, please wait just a little longer . I am sure he will be back now . He doesn’t normally hang around there too long
ඕ නෝ , ප්ලීස් වේට් ජස්ට් අ ලිට්ල් ලෝන්ග(ර්). අයෑම් ෂුව(ර්) හී විල් බී බැක් නව් .හී ඩස්න්ට් නෝමලි හැං අරවුන්ඩ් දෙයා(ර්) ටූ ලෝං
නෑ , තව පොඩ්ඩක් ඉන්න , මට විස්වාසයි එයා දැන් ඒවි , එයා සාමාන්‍යයෙන් වැඩිවෙලා එතන ගැවසෙන්නේ නෑ (hang around - ගැවසෙනවා, රස්තියාදු වෙනවා)

A- Can't you give him a call, please ?
කාන්ට් යූ ගිව් හිම් අ කෝල් ?
ඔයාට බැරිද ඔහුට කෝල් එකක් දෙන්න

B - The problem is he has left behind his phone. He is very forgetful . He always forgets things .
ද ප්‍රොබ්ලම් ඉස් හී හෑස් ලෙෆ්ට් බිහයින්ඩ් හිස් ෆෝන් .හී ඉස් වෙරි ෆොගෙට්ෆුල්. හී ඕල්වේස් ෆොගෙට් තිංග්ස්
ප්‍රශ්නේ කියන්නේ එයා phone එක දාල ගිහිල්ලා, එයාට හරියට අමතක වෙනවා, එයාට තිස්සෙම දේවල් අමතක වෙනවා (leave behind - කියන්නෙ යමක් දාල යනවා, leave වල එහි අතීත සහ past particpal රූපය left) ( forgetful - අමතක වන සුලු )

A - I see , Ok , I will wait until he comes
අයි සී , ඕකේ , අයි විල් වේට් අන්ටිල් හී කම්ස් .
හරි මම එයා එනකල් ඉන්නම්

**Vocabulary 30**

Quarrel – ක්වරල් – රණ්ඩු වෙනවා , රණ්ඩුව

Beachside – බීච්සයිඩ් – වෙරළබඩ , මුහුදු තීරය අසල

Repeatedly – රිපීටඩ්ලි – නැවත නැවත , යලි යලිත්

Successfully – සක්සස්ෆුලි – සාර්ථකව

Unsuccessfully – අන්සක්සස්ෆුලි – අසාර්ථකව

Regularly – රෙගියුල(ර්)ලි – නිතිපතා , නිරන්තරයෙන් , අඛණ්ඩව

Demise – ඩිමයිස් – මරණය

Surgery – ස(ර්)ජරි – ශල්‍යකර්මය

Ancestral – ඇන්සෙස්ට්‍රල් – මුතුන් මිත්තන්ට අයත් ,පාරම්පරික

Private – ප්‍රයිවට් – පුද්ගලික , පෞද්ගලික

Convenient – කන්වීනියන්ට් – පහසු

Extent – එක්ස්ටෙන්ට් – ප්‍රමාණය

Backyard – බැක්යාඩ් – පිළිකන්න , පිටුපස වත්ත

Front yard - ෆ්‍රන්ට් යාඩ් - මිදුල

plant - ප්ලාන්ට් - පැලය

cost - කොස්ට් - මිල වෙනවා , මිල

afford - අෆෝඩ් - දරනවා (වියදම )

Leave behind – ලීව් බිහයින්ඩ් – අත්හැර දමා යනවා

Forgetful – ෆොගෙට්ෆුල් – අමතක වන ස්වභාවය ඇති , මතකය අඩු

Space – ස්පේස් – අවකාශය , ඉඩ

Avoid – අවොයිඩ් – මගහැර ඉන්නවා , වළක්වාගන්නවා

Childhood – චයිල්ඩ්හුඩ් – ළමාකාලය

Beachside – බීච්සයිඩ් – මුහුදු වෙරළ අසල, වෙරළ පැත්ත

Property – ප්‍රොප(ර්)ටි – දේපළ / සම්පත්

University – යුනිව(ර්)සිටි – විශ්වවිද්‍යාලය

Reasonable – රීසනබල් – සාධාරණ

Education – එඩියුකේෂන් – අධ්‍යාපනය

Educate – එඩියුකේට් – අධ්‍යාපනය දෙනවා, උගන්නනවා

Condition – කන්ඩිෂන් – තත්ත්වය, කොන්දේසිය

Muck – මක් – කුණු, අපිරිසිදු ද්‍රව්‍ය , ජරාව

Mould – මෝල්ඩ් – හැඩය, ආකෘතිය

Quit – ක්විට් – අත්හරිනවා, හැර යනවා

Puzzle – පස්ල් – ප්‍රහේලිකාව, ගැටලුව

Riddle – රිඩ්ල් – ප්‍රහේලිකාව, ප්‍රශ්නයක්

Precise – ප්‍රිසයිස් – නිවැරදි, නිශ්චිත

Posture – පොස්ච(ර්) – ශරීර ඉරියව්ව, සිටින ආකාරය

Pot – පොට් – භාජනය, මුට්ටිය

Election – ඉලෙක්ෂන් – මැතිවරණය, ඡන්දය

Candidate – කැන්ඩිඩේට් – අපේක්ෂකයා, තරඟකරුවා

Babysitter – බේබිසිට(ර්) – දරුවන් බලාගන්නා අය

Backbone – බැක්බෝන් – කොඳු නාරටිය

Background – බැක්ග්‍රවුන්ඩ් – පසුබිම

Banter – බැන්ට(ර්) – විහිළුව , සරදම

Bare – බෙයා – නිරුවත්; හිස්

Barefoot – බෙයාෆුට් – පාවහන් නැතිව

Bare land – බෙයා ලෑන්ඩ් – හිස් භූමිය

Barely – බෙයාලි – යන්තම්

Camphor – කැම්ෆ(ර්) – කපුරු

Crab – ක්‍රැබ් – කකුළුවා

Complain – කොම්ප්ලේන් – පැමිණිලි කරනවා

Complaint – කොම්ප්ලේන්ට් – පැමිණිල්ල

Coincidence – කොයින්සිඩන්ස් – අහඹු සිදුවීම, අහම්බය

Clown – ක්ලවුන් – විකටයා

Donor – ඩෝන(ර්) – දායකයා, පරිත්‍යාගශීලියා

Doubt – ඩවුට් – සැකය / සැක කරනවා

Doubtful – ඩවුට්ෆුල් – සැක සහිත

Dough – ඩෝ – පිටි මෝලිය , ඇනූ පිටි ගුලිය

Dozen – ඩෝසන් – දොළහක්

Drawer – ඩ්‍රෝව(ර්) – ලාච්චුව

Drought – ඩ්‍රවුට් – නියඟය

Drip – ඩ්‍රිප් – බිංදුවෙන් බින්දුව වැටෙනවා, බිංදු බිංදු ලෙස ගලා යනවා

Earthquake – අ(ර්)ත්ක්වේක් – භූමිකම්පාව

Eatable – ඊටබල් – කෑමට සුදුසු, ආහාරයට ගත හැකි

Fabulous – ෆැබියුලස් – අතිශයින් විශිෂ්ට, පුදුමාකාර, මාහැඟි

Fade – ෆේඩ් – මැකී යනවා, අවපැහැ වෙනවා

Failure – ෆේලිය(ර්) – අසාර්ථකත්වය, අසමත් වීම

Handrail – හෑන්ඩ්රේල් – අත් වැට

Hand-picked – හෑන්ඩ් පික්ට් – තෝරාගත්, විශේෂයෙන් තෝරාගත්

Hardship – හාඩ්ෂිප් – දුෂ්කරතාව, දුක් කම්කටොලුව

Harmful – හාම්ෆුල් – හානිකර